
# අපූරු ගෙදර බිහිසුණු රැයක්



එල්. ඒ. සඳලි සම්මානි
4- D

# අපූරු ගෙදර බිහිසුණු රැයක්

එල්.ඒ. සඳලි සම්මානි



අපුරු ගෙදර බිහිසුණු රැයක්


කතාව සහ චිත්‍ර

එල්.ඒ. සඳලි සම්මානි
3 ශ්‍රේණිය D
මහාමායා බාලිකා විද්‍යාලය
මහනුවර


කතෘගේ වෙනත් කෘති

සුදු පුසා


කෘතිය පළ කරන දිනය

2025 පෙබරවාරි

ISBN අංකය

978-624-208-379-7

# පිදුම

පුංචි මගේ ජීවිතය ජයගන්නට

ආදරයෙන් , කරුණාවෙන් , දැනුමෙන්

මගේ ලොව එළිය කරමින් අත්වැලක්

වෙන්නා වූ මගේ

ආදර නිලූෂිකා ගරුසිංහ ගුරු මෑණියන්ට

මෙම පොත

සෙනෙහසින් පුද කරමි



# පෙර වදන...

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුගයේ කැපී පෙනෙන්නේ ද සාහිත්‍යයමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වර්ෂ ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි .

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛනකරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය.
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මම උදෑසන පාසල් යාමට සූදානම් වුණා. අද අපට පාසලේ නිවාඩු දෙන දවසයි. අද සිට මාසයක් පුරාවට නිදහසේ සෙල්ලම් කිරීමට හැකියි. පාසල අවසන් වීමෙන් පසු මම ගේට්ටුව අසළට ආවා.

වෙනදා වගේම මගේ අම්මා මා බලාපොරොත්තුවෙන් ගේට්ටුව අසළ සිටියා. ඇය මාව අපගේ කාරයට නංවා ගත්තා. '' අපි හෙට සීයලා ගෙදර යනවා. වාහනය පදවන ගමන් ඇය  පැවසුවා.



'' යේ, මට හරිම සතුටුයි අම්මේ.'' ''මේ සැරේ නිවාඩුවනම් හරි ම සතුටින් මට ගත කරන්න පුලුවන් වෙයි.''

නිවසට පැමිණි මම මාගේ රෙදි බෑගය සුදානම් කරගත්තා. දැන් රෑ බෝ වෙලා. මම රෑ කෑමෙන් පසු දෙමාපියන් වැඳ නින්දට ගියෙමි.



තාත්තාත්, අම්මාත්, මාත්  උද්‍යෑසනින්ම සීයලා ගෙදර යන්න පිටත් වුණා. සීයලාට අවශ්‍ය සියලු  දේ අපි මගදී මිලට ගත්තේමු.



අපි නුවරඑළියට කිට්ටු වුණා. මෙහේ හරිම සීතලයි. හැම තැනම මීදුම . පාරක්වත් පේන්නේ නෑ. ඒත් තාත්තා පරිස්සමෙන් කාරය එලවාගෙන සීයලාගේ වත්තට ඇතුළු වුණා.

සීයලාගේ ගෙදර තියෙන්නේ ලොකු තේ වත්තක් මැද, කන්නදක් උඩ.

ඒ ගෙදර හරිම ලොකුයි. ඒ වගේම පාළුයි. කොච්චර ලොකු ගෙයක් වුණාත් ඒ ගෙදර ඉන්නේ අත්තම්මයි, සීයයි විතරයි.

හුගක් කාමර වහලා තිබුණා. අත්තම්මා අපිටම ඉන්න කියලා සුදානම් කර තිබුණු කාමරය අපට පෙන්නුවා.

'' මේ කාමරය තමා චුටි දුවගේ තාත්තා ඉස්සර හිටිය කාමරය.'' ඔන්න ඔයාලට මම ඒකම ලෑස්ති කළා. අත්තම්මා කිවුවා. අපි ඒකට ගියා. ඉන් පසු තාත්තා රැකියාවට යෑමට සුදානම් වුණා. '' පුතේ මෙහේ තනියම ඇවිදින්න යන්න එපා.''

''අම්මලා කියනදේ අහලා පරිස්සමෙන් ඉන්න.'' කියා තාත්තා උපදෙස් දී රැකියාවට යන්න පිටත් වුණා.



'' පුතේ එහෙනම් ඔයාලා ඇඟපත සෝදාගෙන එන්න. මම තේ ටිකක් හදාගෙන එන්නම්.'' අත්තම්මා කීවා.'' හා අම්මේ.'' අම්මා කීවා. ඉන්පසු මම නාන කාමරයට ගියා. ඒක මහ විශාල නාන කාමරයක්.

මම ඒකේ දොර වහද්දී ''දඩාං'' ගාලා මහා විශාල ශබ්දයක් නැගුණා.

මම හුඟක් බය වුණා. ඒකේ වතුර හරිම සීතලයි. ඉන් පසු මම ඇඟ සෝදාගත්තා. ඉන් පසු අම්මාත් ඇඟ සෝදාගත්තා. අපි තේ බොන්න කෑම කාමරයට ගියා.





අත්තම්මලා ගේ ගෙවල් ළඟ ගෙයක් තිබුණා. ඒ ගෙදර අක්කා කෙනෙක් හිටියා. එයාගේ නම නෙත්මි. එයා ආච්චිලාගේ ගෙදර ආවා . මාත් එක්ක සෙල්ලම් කරන්න. ''නංගි අපි මොකක්ද කරන සෙල්ලම.'' නෙත්මි අක්කා ඇහුවා.

අපි හැංගිමුත්තෝ කරමු. ඊට කලින් අපි අර වහල තියන කාමරය බලමුද. ? අපි කාමර වලට ගියා. එක කාමරයක පඩිපෙළක් තිබුණා. අපි ඒක දිගේ පහළට පහළට ගියා . අපේ ඔළුව උඩින් සතෙක් පියෑඹුවා.''

මේ මොකෙක් ද මේ''? නෙත්මි අක්කයි, මමයි කෑගැසුවා . එතකන් ඒ වවුලෙක් .

'' අනේ අක්කි මට ගෙදර යන්න ඕන.  හා හරි අපි යමු.'' අපි උඩට යද්දි ලොකුම ලොකු මකුළුවෝ බිත්තියේ නගිනවා. හැම තැනම මකුළු දැල් බැඳලා.  පාරවත් පේන්නේ  නෑ. අපිව අම්මලා හොයනවා ඇති කියලා අපි බයවුණා. ''අනේ නංගි මට හොඳටම බඩගිනියි.'' නෙත්මි අක්කා කිවුවා.  අපි දෙන්නම හයියෙන් ඇඬුවා.





අනේ අක්කි අපි කොහොමහරි පාර හොයාගෙන යං. ඔව් නංගී අපි පාර හොයාගෙන යං.

අපි මේ පාරේ නේද ආවේ. ඔව් අක්කි, මේ පාර තමා මට මතකයි පාරේ පඩිපෙළේ මෙතන කැඩිලා තිබුණා.

එකපාරම අපි ඉස්සරහින් උස ඇඟක් තියන , ඇඟ පුරා මයිල් ,උල් දත් තියන ඇස් වලින් ගින්දර මතුවෙන යකෙක් මතුවුණා. '' අනේ අම්මේ මාව බේරගන්න. '' මම හයියෙන් කෑගැහුවා.



'' ඇයි , ඇයි පුතේ  මොකද වුණේ ඔයා හීනෙන් බයවුණා ද? අපි අද අත්තම්මලා ගෙදර යන්නත් තියනවා , ඉක්මනට නැගිටලා ලෑස්තිවෙන්න.''  අම්මා කීවා .අනේ දෙවියනේ මම ඒ දැකළා තියෙන්නේ හීනයක් ද?

**නිමි..**

# පසු වදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යයන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍යය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදිශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමගම දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්ණ නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකට සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යයන්තර පාඨකයින් වෙත ගෙන යාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩ නගා දී තිබේ. තම නිසාය සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක
සෙනෙවිරත්න මහලේකම්